(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 181.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2012 මැයි මස 08 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0850/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මධ්‍යම රජයට, පළාත් සභාවලට සහ නගර සභාවලට අයත් මාර්ග ඉදිකිරීම හා නඩත්තුව සඳහා 2006 සිට 2011 දක්වා වෙන්කරන ලද මුදල වාර්ෂික පදනමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2006 සිට 2010 දක්වා, ඉහත සඳහන් ආයතන තුන විසින් සියලු ආකාරයේ මාර්ග සඳහා දරන ලද මුළු පිරිවැය කොපමණද;

(iii) 2012 වර්ෂයේදී මාර්ග ඉදිකිරීම හා නඩත්තුව සඳහා වෙන් කිරීමට නියමිත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අ (i) හි සඳහන් මාර්ග ඉදිකිරීම් සහ නඩත්තුව සඳහා වූ අරමුදල්වල මූලාශ්‍රයන් කවරේද;

(ii) එය ණය ප්‍රාග්ධනයක් නම්, ණය ගැනුම් පිරිවැය සහ ණය ලබාදුන් රටවල් හෝ ආයතනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2006, 2007, 2008, 2009 සහ 2010 වර්ෂවල නිමකරන ලද මාර්ග ඉදිකිරීම් වෙනුවෙන් රජය විසින් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1272/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 සහ 2010 වර්ෂවලදී දිවයින පුරා පිහිටි පළාත් පාසල් හා ජාතික පාසල්වල පැවති සෞන්දර්ය ගුරු පුරප්පාඩු 3174ක් පිරවීම සඳහා සෞන්දර්ය උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවූ බවත්;

(ii) ඒ අනුව පැවති ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ලිඛිත පරීක්ෂණයෙන් සහ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව මේ දක්වා සෞන්දර්ය උපාධිධාරීන් සඳහා ලබාදී ඇති මුළු ගුරු පත්වීම් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පවතින සියලුම සෞන්දර්ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා නොගත්තේ නම්, ඉතිරි සෞන්දර්ය උපාධිධාරීන්ට ගුරු පත්වීම් ලබා දෙන දිනය කවරේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1675/'11

3.

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1797/'11

4.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වන විට ඉතාලියේ රැකියාවල යෙදෙමින් ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයා දෙන ශ්‍රමිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ වැටුපෙන් සේවක අර්ථසාධක කපා ගැනීම, බදු අයකිරීම ඇතුළු අනෙකුත් අය කිරීම් එරට රජය විසින් සිදු කරන්නේද;

(iii) එසේ නම්, අයකර ගන්නා ලද සම්පූර්ණ මුදල හෝ ඉන් යම් ප්‍රමාණයක් හෝ අප රටට මේ වන තෙක් ලබා දී තිබේද;

(iv) නොඑසේ නම්, ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සේවයෙන් ඉවත්වී පැමිණීමේදී එරට රජය විසින් ඔවුන් වෙත යම් මුදලක් ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දීර්ඝ කාලීනව විදේශ රටවල සේවය කරමින් විදේශ විනිමය උපයා දෙන ශ්‍රමිකයන් හට විශ්‍රාම වැටුපක් ලබාදීමට රජය කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1917/'11

5.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති පාසල් අතරින් "ද්විතියික පාසල් 1000" ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන ඇති පාසල් කවරේද;

(ii) ක/වැවිට මෛත්‍රී මහා විදුහල "ද්විතියික පාසල් 1000" ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2050/'11

6.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට මූලික රෝහලට ප්‍රතිකාර සඳහා පැමිණෙන අක්ෂි රෝගීන්ට හම්බන්තොට නගරයේ පෞද්ගලික ඇස් පරීක්ෂාකරන ස්ථානවලින් ඇස් කණ්නාඩි හා අක්ෂි කාච ලබාගන්නා ලෙස රෝහල් නිලධාරීන් උපදෙස් දෙන බවත්;

(ii) එම ආයතන විසින් අක්ෂි කාච අධික මිලකට අලෙවි කරන බවත්;

(iii) රෝහල් නිලධාරීන්ගේ ක්‍රියා කලාපය නිසා අසරණ රෝගීන් විවිධ අපහසුතාවලට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අක්ෂි සායනයේ පවතින ඉහත තත්ත්වය පිළිබඳ විශේෂ පරීක්ෂණයක් පවත්වා දූෂණ ක්‍රියා නතර කරවීමට පියවර ගන්නේද;

(ii) රෝහලෙන් නිකුත් කරනු ලබන පරීක්ෂණ වාර්තා අනුව අක්ෂි රෝගීන්ට නිර්දේශිත ඇස්කණ්නාඩි හා අක්ෂි කාච රාජ්‍ය ඔසුසලෙන් අවම මිලකට ලබා ගැනීම සඳහා පහසුකම් සලසාදෙන්නේද;

(iii) රාජ්‍ය ඔසුසලෙන් නිකුත් කරනු ලබන අක්ෂි කාච යොදාගෙන රෝගීන්ට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය උපදෙස් රෝහල් බලධාරීන්ට ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) ඊට අදාළව ගැටලු මතුවන්නේ නම්, එම රෝහල සහ රාජ්‍ය ඔසුසල ඒකාබද්ධව වැඩසටහනක් හඳුන්වාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2146/'11

7.

ගරු වයි. ජී. පද්මසිරි මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරනු ලබන පාසල් 1000 වැඩසටහන යටතේ පෝෂිත ප්‍රාථමික පාසල් 5000ක් සංවර්ධනය කිරීමට අරමුණු කරගෙන සිටින බැවින්, එම ව්‍යාපෘතියටද ගැලපෙන පරිදි, යෝජිත පෝෂිත ප්‍රාථමික පාසලකට ආසන්න පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන (පෙර පාසල්) දෙක බැගින් දියුණු කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ තෝරා ගනු ලබන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරු භවතුන්ට යෝග්‍ය පුහුණු පාඨමාලාවක් ලබා දෙන්නේද;

(iii) එම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට අවශ්‍ය භෞතික පහසුකම් සලසන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2233/’12

8.

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 අයවැය යෝජනා සහ ඒ අනුව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2010 අනුව ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන්ගේ වැටුප් හා දීමනා සංශෝධනය සිදු කර නොමැති බවත්;

(ii) එම ගුරුවරුන් ඔවුන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් අනුව නිසි වැටුප් පියවරයන්හි පිහිටුවීම මෙතෙක් සිදු කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වැටුප් සංශෝධනය කිරීම හා ගුරුවරුන් නිසි වැටුප් පියවරයන්හි පිහිටුවීම සම්බන්ධයෙන් උපදෙස් දෙමින් මෑතකදී කලාප අධ්‍යාපන කාර්යාල වෙත චක්‍රලේඛයක් යවා තිබේද;

(ii) නොඑසේ නම්, ගුරුවරුන්ගේ වැටුප් සංශෝධනය කිරීමට අදාළ තත්ත්වය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1641/’11

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ පිහිටි විශාලතම වාරි යෝජනා ක්‍රමයක් වූ බුත්තල, මාලිගාවිල, සද්ධාතිස්ස වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන්කර වර්ෂ දහනවයක් ගතවී ඇති බවත්;

(ii) එම යෝජනා ක්‍රමය යටතේ ඇති වගා ඉඩම් මේ දක්වා ගොවීන්ට බෙදා දී නොමැති බවත්;

(iii) අවස්ථා කිහිපයකදීම ඉඩම් ලබා දීම සඳහා ඉඩම් කච්චේරි පවත්වා සුදුසු ගොවීන් තෝරාගෙන ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉඩම් ලබා දීම සඳහා ගොවීන් තෝරාගෙන තිබියදීත්, එම ගොවීන්ට ඉඩම් ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම ගොවීන්ට ඉඩම් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1709/’11

10.

ගරු රවී කරුණානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අනවසරයෙන් මසුන් ඇල්ලීමේ ගැටලුව විසඳීමට අමාත්‍යාංශය සමත් වී තිබේද;

(ii) දැනට ශ්‍රී ලංකාවේ අත්අඩංගුවේ සිටින ඉන්දියානු ධීවරයන් සංඛ්‍යාව සහ ඉන්දියාවේ අත්අඩංගුවේ සිටින ශ්‍රී ලාංකික ධීවරයන් සංඛ්‍යාව කොපමණද;

(iii) කච්චතිවු දූපතේ මසුන් ඇල්ලීම සිදු කෙරෙන්නේද;

(iv) කච්චතිවු දූපතේ මසුන් ඇල්ලීම තහනම් කරමින් ශ්‍රී ලංකාව වෙත ඉදිරිපත් කරන ලද අසාධාරණ හිමිකම් පෑම පිළිබඳ ගැටලුව විසඳනු ලැබ තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ සිටින ලියාපදිංචි ධීවරයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් මුහුදේ සිටින ස්ථානය හඳුනාගැනීම සඳහා එම ධීවරයන්ගේ ධීවර යාත්‍රාවලට GPRS පහසුකම් සපයා තිබේද;

(iii) ඉහත සඳහන් ධීවරයන් රක්ෂණය කරනු ලැබ තිබේද;

(iv) පසුගිය වර්ෂ පහ තුළ එක් එක් වර්ෂයේදී රැකියාවේ යෙදී සිටියදී අතුරුදහන් වූ ධීවරයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1907/'11

11.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රචාරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික රූපවාහිනිය සතු ක්‍රීඩා තරග පටිගත කළ කැසට් පට හෝ දෘඪ තැටි කාල්ටන් ක්‍රීඩා නාලිකාව (CSN) වෙත ලබා දීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) එම කැසට් පට හෝ දෘඪ තැටි ලබා දුන් පදනම කවරේද;

(iv) එම කැසට් පට ලබා ගැනීම වෙනුවෙන් කාල්ටන් ක්‍රීඩා නාලිකාව විසින් ජාතික රූපවාහිනිය වෙත ගෙවන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කාල්ටන් ක්‍රීඩා නාලිකාව විසින් එම කැසට් පට හෝ දෘඪ තැටි ලබා දෙන ලෙස ඉල්ලීමක් කළේ නම්, එම ඉල්ලීම් කළ අයගේ විස්තර කවරේද;

(ii) එකී ඉල්ලුම් ලිපිය කුමක්ද;

(iii) ජාතික රූපවාහිනිය විසින් එකී කැසට් පට හෝ දෘඪ තැටි නිදහස් කිරීමට බලය ලබා දුන් නිලධාරියාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1918/'11

12.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) බණ්ඩාරගම විවිධසේවා සමූපකාර සමිතියෙන් සහ එයට අනුබද්ධිත සමූපකාර ග්‍රාමීය බැංකුවෙන් ණය ලබාගෙන, 2011.05.01 දින වන විට එම ණය ගෙවීම පැහැර හැර ඇති අයගේ නම් සහ එක් එක් තැනැත්තා විසින් ගෙවා නොමැති මුදල වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගෙවීම් පැහැර හරින ලද ඉහත ණය මුදල් ආපසු අය කර ගැනීම සඳහා බණ්ඩාරගම විවිධ සේවා සමූපකාර සමිතිය විසින් ගෙන ඇති පියවර කවරේද;

(ii) එසේ පියවර නොගන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1642/'11

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් ගා/අගුළුගල්ල කණිෂ්ඨ විද්‍යාලය වසා දමා ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් පාසල සතු විශාල භෞතික සම්පත් ප්‍රමාණයක් විනාශ වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පාසල නැවත විවෘත කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම විද්‍යාලය නැවත විවෘත නොකරන්නේ නම්, එය වෙනත් ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම්කර තිබේද;

(ii) එසේ නම්, එම ආර්ථික කටයුත්ත කවරේද;

(iii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1710/'11

14.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලාංකික පවුලක ඉපයීම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දරිද්‍රතා රේඛාවට පහළින් සිටින පවුල් සංඛ්‍යාව දිස්ත්‍රික්ක පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ දරිද්‍රතා රේඛාව තීරණය කරන සාධකය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1926/'11

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝක උරුම සිංහරාජ වනාන්තරය අභ්‍යන්තරයෙන් මාර්ගයක් ඉදි කිරීම සඳහා කටයුතු යොදා තිබේද;

(ii) එම මාර්ගය සිංහරාජ වනාන්තරයට අයත් භූමියේ ආරම්භක ස්ථානය සහ අවසන් වන ස්ථානය කවරේද;

(iii) එකී මාර්ගය සිංහරාජ වනාන්තරය හරහා දිවෙන දුර ප්‍රමාණය කොපමණද;

(iv) මාර්ගයේ පළල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය ඉදි කිරීම සඳහා අවසර ලබා දුන් බලධාරියා කවුරුන්ද;

(ii) සිංහරාජ වනාන්තරය හරහා මාර්ගයක් ඉදි කිරීමට හේතු කවරේද;

(iii) සංවර්ධනයේ නාමයෙන් ලෝක උරුම සිංහරාජ වනාන්තරය තුළ සිදු කෙරෙන ඉදි කිරීම් හේතුවෙන් එයට සිදුවන බරපතල විනාශය පිළිබඳ වගකීම දරන අය කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

3.

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"නිමල් සිරිපාල ද සිල්වා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

4.

ගරු ජානක බණ්ඩාර මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මවුන්ට් කාමෙල් අධ්‍යාපනික ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

5.

ගරු රාජීව විජේසිංහ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 4),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"වසන්ත සේනානායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*4.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*5.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*8.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

9.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

10.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

11.

ටී. බී. ඒකනායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

12.

පිය දසුන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**